මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉඩකිරීම් අමාත්‍යාංශය

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

පුරප්පාඩු

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පහත දැක්වෙන තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

සාමාන්‍යාධිකාරී - තනතුරු 01

i. තනතුරු නාමය - සාමාන්‍යාධිකාරී

ii. සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 2-1)

iii. වැටුප් පරිමාණය - කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව,
HM 2-1 2025 - 161,140 - 12X 4,850 - 219,340 / -

iv. මූලික වැටුප - රු.161,140 /- ක මූලික වැටුප තිමිවනු ලබන්නේ 2027.01.01 දින සිටය. බඳවා ගැනීමේ ආරම්භක වැටුප් පියවර කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරන චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි රු. 140,317 /- කි. තොගෙවන වැටුප රු. 20,823 /- කි.

v. සුදුසුකම් -

බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම

සමග

ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සමග

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ වරලත් සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම

සහ

උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක , ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරු වල අවම වශයෙන් වසර දහඅටක (18) පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර 10 ක් වත් මාර්ග ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.)

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම

සමග

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ ආචාර්ය උපාධියක් ලබා තිබීම

සමග

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ වරලත් සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම

සහ

ආචාර්ය උපාධියක් ලබාගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක , ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක සම්පූර්ණ සේවා කාලය වසර පහළොවක් (15) ක් එම සේවා කාලයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් මාර්ග ක්ෂේත්‍රයේ වසර පහක (05) විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර පහක (05) අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

සමග

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහි ලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහි ලා ප්‍රවීණතාවයක් ලබා තිබීම.

vi. වයස - වයස අවු. 35 ට නොඅඩු හා අවු.55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

vii. මාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ සේවා පළපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

viii. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

ප්‍රධාන ඉන්ජිනේරු - තනතුරු 01

i. තනතුරු නාමය - ප්‍රධාන ඉංජිනේරු

ii. මාසික දීමනාව - MM 1-1 වැටුප් ක්‍රමයේ II ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවරට අදාළ වන පරිදි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II හි සඳහන් පරිදි රු.81,710/- ක් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2024 අනුව ජීවන වියදම් දීමනාව රු.17,800 / - ක් වන පරිදි මාසිකව රු. 99,510 /- ක දීමනාවක් හිමි වේ.

iii. සුදුසුකම් -
කළමනාකාර (MM) සේවා ගණයේ ඉංජිනේරු (සිවිල්) තනතුරෙහි I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම

සමග

ඉංජිනේරු ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ වරලත් ඉංජිනේරුවරයෙකු (සිවිල්) ලෙස ලියාපදිංචි වී තිබීම.

iv. වයස - වයස අවු. 22 ට නොඅඩු හා අවු.45 ට නොවැඩි විය යුතුය.

v. මාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ සේවා පළපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

vi. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

vii. පත්කිරීමේ ස්වභාවය - කොන්ත්‍රාත් පදනම මත

පොදු කොන්දේසි

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

4. සෑම අයදුම්කරුවෙකුම තනතුරට බඳවා ගැනීම සඳහා අදාළ වන සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5. අධිකාරියේ ස්ථිර පත්වීම් ලද අය පමණක් අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස සලකනු ලැබේ.

6. රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක සේවය කරනු ලබන්නේ නම් ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුයි.

7. අයදුම්කරුවන් විසින් නමාගේ ජීව දත්ත අඩංගු අයදුම්පත සකස් කර එවිය යුතු අතර , තමා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ලෙසින් නොවන තිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.

8. ඔබ විසින් යොමු කරනු ලබන අයදුම්පතුයේ සඳහන්ව ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් නුසුදුස්සෙකු සේ සලකා ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. මාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරු කැඳවීම මෙම තනතුර සඳහා පත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් ජීව දත්ත විස්තර ඇතුළත් කර සකස් කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත්ද (සහතික කරන ලද) සමග බහා එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය පැහැදිලිව සඳහන් කර 2026.12.04 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපලෙන් පමණක් යොමු කළ යුතුය.

2026.12.04 දිනට පසු ලැබෙන අයදුම්පත්, අයදුම්පත බහාලන ලිපි කවරයේ තනතුර සඳහන් කර නොමැති අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් ලෙස සලකා ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබේ.

මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සාමාන්‍යාධිකාරී,
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
මධ්‍යම පළාත.

පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
අංක 09,
ඇහැලේපොල කුමාරිහාමි මාවත,
බෝගම්බර,
මහනුවර.
දුරකථන අංකය - 081-2204378